# මනස හදට ගෙනයෑම

මනස හදට ගෙන යෑමට හැකි වන්නේ මනස මේ ශරර කුඩුවෙන් පිටත ද ඇත්නම් ය. එනම් චිත්තයක් ශරර කුඩුවෙන් පිටත ද ඇතිවන්නේ නම් ය. ඒ ඒ පුද්ගලයා අනුව චිත්ත පිටත ද ඇතිවීමේ හැකියාව වෙනස්වන්නේ යැයි සිතිය හැකි ය. දිවැස් ඇත්තකුගේ මනස බාහිර ව ඇති තරමට සාමාන්‍ය පුද්ගලයකුගේ මනස බාහිර ව ඇතැයි සිතිය නො හැකි ය. සාමාන්‍ය පුද්ගලයන්ගේ මනස් බොහෝ විට ශරරාභ්‍යන්තරයෙහි තිබෙනවා විය යුතු ය.

චිත්ත පිළිබඳ ඉතා ගැඹුරු විග්‍රහයක් අභිධර්මයෙහි වෙයි. හැගොඩ බෙමානන්ද හිමියන්ගේ ථෙරවාද න්‍යාය යන ග්‍රන්ථයෙහි ද චිත්ත ගැන විස්තරයක් වෙයි. මනස පිළිබඳ අපේ ප්‍රවාද නිර්මාණය කරන්නන්ට මේ පොත් කියවීම අනිවාර්ය වෙයි. මා මෙහි දී කරන්නේ මනස පිළිබඳ අපේ ප්‍රවාද නිර්මාණකරණයට යම් මඟ පෙන්වීමක් පමණකි. ථෙරවාදී න්‍යායෙහි විස්තර කෙරෙන අන්දමට චක්ඛු, රූප, ආලෝක, සමන්නාහාර, ආභොග, මනසිකාර යන හයේ සංගතියෙන් චක්ඛු විකද්කදාණය ඇතිවෙයි. මෙය ප්‍රත්‍යකෂ ඥානයක් වෙයි. සත්ත්වයා (නිරකෂකයා) යමක් දකිනවා යන්නෙන් අදහස් කරන්නේ ඒ ප්‍රත්‍යකෂයෙන් දන්නා බව ය.

අපේ සම්ප්‍රදාය වූ සිංහල ථෙරවාදයෙහි ඇත්තේ බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය පමණක් නො වෙයි. පසුකාලීනව ථෙරවාදීන් විසින් වර්ධනය කරනු ලැබූ කරුණු ද එහි අඩංගු වෙයි. එසේ වර්ධනය කෙරුණු ආකාරය අප අධ්‍යයනය කළ යුතු අතර වර්ධනය කෙරුණු කරුණු පිළිබඳව අප අනිවාර්යයෙන් ම එකඟ විය යුතු නො වේ. එහෙත් අපේ සම්ප්‍රදාය ඇත්තේ ඒ වර්ධනයන්හි බව අමතක නො කළ යුතු ය.

ඉහත සඳහන් කරුණුවලින් චක්ඛු යන්නෙන් අදහස් කෙරෙන්නේ නො මැරුණු අයකුගේ හා සෙම්, පිත් ආදී දෝෂයෙන් ආබාධයට ලක් නො වූ ඇසකි. මෙහි දී රූප යන්න මලක්, මේසයක් වැනි දෙයක් ලෙස අපට ගත හැකි ය. ආලෝක යන්න පැහැදිලි ය. ආලෝකය නැතිව චක්ඛු විකද්කදාණයක්, පෙනීමක් ඇති නො වෙයි. සමන්නාහාර යනුවෙන් අදහස් කෙරෙන්නේ අරමුණට යොමු කිරම ය. ඇසක් තිබුණ ද, මලක් තිබුණ ද, ආලෝකය තිබුණ ද ඇස මල කෙරෙහි යොමු කර නැත්නම්, එවිට නිරකෂකයාට මල නො පෙනෙයි. මානසිකාර යනු ක්‍රියා මනෝධාතුව භවංගයෙහි ආවර්තනය වීම යැයි සඳහන් වෙයි. ඉන් කියැවෙන්නේ කුමක්දැයි පැහැදිලි නැති වුවත් රූපය හා මනස එකතුවීමක් මගින් භවංග චිත්තය වෙනස් කිරමක් අදහස් වන්නේ යැයි සිතිය හැකි ය.

චිත්තය ශරරයේ ඕනෑ ම තැනක ඇති විය හැකිය යන්න ථෙරවාදී සම්ප්‍රදායෙන් අපට ලබාගත හැකි දැනුම ය. ඉදිකටුවකින් හමේ කොතැනකට ඇන්නත් එතැන චිත්තයක් ඇති වෙයි. එහි දී සිදුවන්නේ ගැටීමක් යැයි අවශ්‍ය නම් කිව හැකි ය. අපට ප්‍රශ්නයක් වන්නේ බාහිර වස්තු යැයි අප විසින් හැඳින්වෙන වස්තු සම්බන්ධයෙන් මේ ගැටීම ඇතිවන්නේ කෙසේ ද? කොතැනක ද යන්න ය. හම නම් අවයවය ගත්විට එය ඉන්ද්‍රියක් බවට පත්වන්නේ මනසත් සමග එකතුවීමෙන් බව පැහැදිලි ය. චක්ඛු විකද්කදාණය ඇතිවීමට අවශ්‍ය කරුණු මෙන් එහි දී ද යම් යම් කරුණු සපුරාලීමට අවශ්‍ය වෙයි. හම නම් ඉන්ද්‍රියට යමක් දැනෙන්නේ හම නම් අවයවය සමග යමක් ස්පර්ශවීමෙන් (ගැටීමෙන්) හා මනස ද එහි දී ක්‍රියාත්මක වීමෙන් ය.

එහෙත් ඇස බාහිර වස්තු යනුවෙන් හැඳින්වෙන වස්තු සමග ගැටෙයි. එහි දී යමකුට කිවහැක්කේ බාහිර වස්තුවෙන් සෘජුව හෝ පරාවර්තනය වී හෝ ලැබෙන ආලෝකය ඇස සමග ගැටී මනස ද ක්‍රියාත්මක වීමෙන් ඒ වස්තුව අපට පෙනෙන බව ය. ඒ අරුතින් ගත් කල යමක් (ආලෝකය) ඇස හා ගැටීමෙන් පසු අපට පෙනීම ඇති වෙයි. මා මෙහි දී යොමු කිරමට බලාපොරොත්තු වන්නේ ඇසට ආලෝකය පැමිණෙන තෙක් ඒ වස්තුව අපට නොපෙනෙන්නේ ද යන්න ය. ආලෝකය ඇසට ලැබී ඇස ඔස්සේ චිත්තයක් ඇතිවන තෙක් අපට ඒ දැන ගැනීමට නොහැකි වන්නේ ද?

චිත්තය ඇතිවන්නේ රුධිරය ආශ්‍රිතව පමණක් නම් ඒ එසේ සිදුවනවා විය යුතු ය. එහෙත් දෙවියන්, බඹුන් වැනි සත්ත්වයනට ලේ ඇතැයි අපි නො සිතමු. එසේ නම් ඔවුන් බාහිරව ඇතැයි කියන වස්තුවක් දකින්නේ කෙසේ ද?

© Prof. Nalin De Silva

අභිඥාවන්ට අයත් දිවැස් මගින් වස්තු දැකීමේ දී සිදුවන්නේ කුමක් ද? එහි දී සිදුවන්නේ හුදු මනස පමණක් ක්‍රියාත්මක වීමක් ද? එසේ නම් දිවැස් මගින් දකින්නේ ධර්මතාවක් පමණක් ද?

අභිධර්මය එයට පිළිතුරක් ලබාදෙයි. අභිධර්මයට අනුව දිවැස් මගින් දකින්නේ ද රූපයකි. එය ධර්මතාවක් නො වෙයි. මෙහි දී ආලෝකය පිළිබඳ ප්‍රශ්නය පැන නගියි. දිවැසින් දකිද්දී ආලෝකය අනවශ්‍ය ද? දුරේක්ෂයකින් ආකාශ වස්තුවක් දෙස බැලීමේදී වස්තුවෙන් ලැබෙන ආලෝකය හෝ වෙනත් විකිරණයක් වැදගත් වෙයි. උදාහරණයක් ලෙස දුරේක්ෂය, ගුවන් විදුලි දුරේක්ෂයක් නම් ආකාශ වස්තුවෙන් ලැබෙන ගුවන් විදුලි තරංග උපයෝගී කර ගැනෙයි. ඒ කුමන තරංගයක් යොදා ගත්ත ද ඒ තරංග ආකාශ වසතුවේ සිට අදාළ දුරේක්ෂය වෙත පැමිණෙන තෙක් ආකාශ වස්තුව නිරක්ෂකයාට නො පෙනෙයි.

කිනම් විකිරණයක් වුව ද එයට ආකාශ වස්තුවේ සිට දුරේක්ෂයට පැමිණීමට යම් කාලයක් ගත වෙයි. මේ විකිරණ විද්‍යුත් චුම්බක විකිරණ වෙයි. ආලෝකය ද විද්‍යුත් චුම්බක විකිරණ විශේෂයක් වෙයි. විද්‍යුත් චුම්බක විකිරණ ප්‍රචලිතවන්නේ (ගමන් කරන්නේ) අලෝකයේ වේගයෙන් ය. ආලෝකයේ වේගයට වැඩි වේගයකින් කිසිවක් සන්නිවේදනය කෙරිය නොහැකි යැයි බටහිර භෞතික විද්‍යාවේ සාපේක්ෂතාවාදයෙන් ඉගැන්වෙයි.

අපට ඈත පිහිටි ආකාශ වස්තුවක් පෙනෙන්නේ එය ඒ මොහොතේ තිබෙන ආකාරයට නො වෙයි. ආලෝකයට ආකාශ වස්තුවේ සිට දුරේක්ෂයට පැමිණීමට කෙතරම් කාලයක් ගත වේ ද? ඒ කාලයට සමාන කාලයකට පෙර ආකාශ වස්තුව තිබූ ආකාරය අපට මේ මොහොතෙහි පෙනෙයි. විකිරණ දුරේක්ෂය වෙත පැමිණෙන තෙක් ආකාශ වස්තුව නොපෙනෙන්නේ යැයි ඉහත සඳහන් කෙරුණේ මේ කරුණ ය. ආකාශ වස්තුව මේ මොහොතේ තිබෙන ආකාරය අපට දැනගත හැකි වන්නේ වස්තුවෙන් මේ මොහොතේ නිකුත් කෙරෙන විකිරණ අදාළ දුරේක්ෂය වෙත පැමිණීමෙන් පසුව ය.

එහෙත් මගේ ප්‍රශ්නය මෙයයි. දිවැස් අති අයකුට මේ මොහොතේ පෙනෙන්නේ යම්කිසි කාලයකට පෙර තිබූ වස්තවක් ද, නැත්නම් මේ මොහොතෙහි ම වස්තුව තිබෙන ආකාරය ද, එසේත් නැත්නම් එයට අතර මැදි තත්ත්වයක් ද? මනස ශරරයෙහි අභ්‍යන්තරයෙහි වුවක් ලෙස සැලකුව හොත් අපට දිවැස් සැලකීමට වන්නේ දුරේක්ෂයක් ආකාරයෙන් ය. එහි දී දිවැස් ඇති අයකුට වුව ද ආකාශ වස්තුවෙන් විකිරණ මනස වෙතට ලැබෙන තෙක් බලා සිටීමට සිදුවෙයි.

එහෙත් දිවැස් ඇතියන්ට එසේ බලා සිටීමට අවශ්‍ය යැයි මම නො සිතමි. එනම් විකිරණ ඈත පිහිටි වස්තුවකින් අපේ ශරරය වෙත ලැබෙන තෙක් බලා සිටීම අනවශ්‍ය විය යුතු ය. මුගලන් රහතන් වහන්සේට හෝ බුදුන් වහන්සේට හෝ එලෙස විකිරණ ලැබෙන තෙක් බලා සිටීමට අවශ්‍ය වී යැයි සිතීමට නොහැකි ය. ඈත පිහිටි සත්ත්වයකුට පිහිට වීමට ඒ සත්ත්වයා ගැන දැන ගැනීමට යම් කාලයක් බලා සිටීමට සිදුවුවහොත් ඒ අදාළ සංඥා පොළොවට ලැබෙන විට ඒ සත්ත්වයා ඒ ලෝකයේ ඇතැම් විට මිය යැමට ද ඉඩ ඇත.

බටහිර භෞතික විද්‍යාව සංනිවේදනයේ වේගයේ සීමා ඇති කරන්නේ විකිරණ ආදී වශයෙන් හෝ ද්‍රව්‍ය ආකාරයෙන් හෝ කෙරෙන සංනිවේදනවලට ය. මනස යනු චිත්ත පරම්පරාවක් නම් හා චිත්ත අරූපාවචර නම් සංනිවේදනය වේගයේ සීමා චිත්තවලට බලපාන්නේ නැතැයි සිතිය හැකි ය. එසේ නම් ආලෝකය හෝ වෙනත් විකිරණයක් හෝ ඈත පිහිටි ආකාශ වස්තුවේ සිට පොළොවට පැමිණෙන තෙක් බලා නො හිඳ මනසට ඒ වස්තුව පිහිටි තැනට යා හැකි ද යන ප්‍රශ්නය අප විසින් අසනු ලැබිය යුතු ය.

මනස ශරරාභ්‍යන්තරයෙහි පිහිටි එකක් නම් මනසට එසේ බාහිර තැන්වලට යැමට නොහැකි විය යුතු ය. අපේ නිගමනය වනුයේ මනස හා එබැවින් ම චිත්ත ද ශරරාභ්‍යන්තරයෙන් බාහිර ව ද, තිබෙන බව ය. ඇතැම් සෘධිමතකුට මනසින් හඳ අත ගෑ හැකි යැයි කියනු ලැබෙයි. එසේ අත ගෑමේ දී හඳෙන් පරාවර්තනය වූ ආලෝකය ඇසට පැමිණෙන තෙක් බලා නොසිට මනස හඳට ගෙන යැමට දිවැස් ඇත්තවුන්ට හැකි වනවා විය යුතු ය.

© Prof. Nalin De Silva

මනස හඳට ගෙන යෑමට හැකි වන්නේ මනස මේ ශරර කුඩුවෙන් පිටත ද ඇත්නම් ය. එනම් චිත්තයක් ශරර කුඩුවෙන් පිටත ද ඇතිවන්නේ නම් ය. ඒ ඒ පුද්ගලයා අනුව චිත්ත පිටත ද ඇතිවීමේ හැකියාව වෙනස්වන්නේ යැයි සිතිය හැකි ය. දිවැස් ඇත්තකුගේ මනස බාහිර ව ඇති තරමට සාමාන්‍ය පුද්ගලයකුගේ මනස බාහිර ව ඇතැයි සිතිය නො හැකි ය. සාමාන්‍ය පුද්ගලයන්ගේ මනස් බොහෝ විට ශරරාභ්‍යන්තරයෙහි තිබෙනවා විය යුතු ය.

කෙසේ වෙතත් මෙයින් කීමට අදහස් කරන්නේ මනස හා චිත්ත ශරරාභ්‍යන්තරයෙහි මෙන් ම බාහිරව ද ඇති බව ය. මනස හා චිත්ත අභ්‍යන්තර කටයුත්තක් පමණක් වන්නේ මනස එතරම් දියුණු නො වූ පුද්ගලයන් සම්බන්ධයෙන් යැයි සිතිය හැකි ය. මනස දියුණුවත් ම මනස හා චිත්ත ශරරභ්‍යන්තරයෙන් වඩ වඩා පිටතට ගැනීමට පුද්ගලයකුට හැකිවනවා විය යුතු ය. මනස හා චිත්ත බාහිර අභ්‍යන්තර අනුව දෙකට බෙදීම ගැන අපේ සංස්කෘතිය අනුව එකඟ විය නොහැක්කකි. සිදුවනු ඇත්තේ බොහෝ කාමාවචර සතුන්ට මනස ශරරාභ්‍යන්තරයෙන් පිටට ගැනීමට නොහැකිවීම යැයි සිතිය හැකි ය.

දිවැස් ඇති අයට පවා වස්තු පෙනෙන්නේ ධර්මතා ලෙස නොව රූප ලෙස ය. මෙය අප අභිධර්මයෙන් ලබාගන්නා වැදගත් කරුණකි. ඒ ඔස්සේ කල්පනා කරන විට මනස හඳෙහි නැත්නම් වෙනත් මන්දාකිණියක වුව ද ඇතැම් අවස්ථාවක තිබිය හැකි යැයි අපට සිතාගත හැකි වෙයි. එවිට හඳ අතගාන්නේ කෙසේ ද ආදී ප්‍රශ්නවලට නිසි පිළිතුරු ලබාදිය හැකි ය.

සටහන ( පසුගිය සතියේ පළවූ ලිපියෙහි වරදක් සිදුවී ඇත. ඉදිකටුවක් පයෙහි ඇඟිල්ලක ඇනුණු විට ඒ බව ඇඟිල්ලෙහි සිට මොළයට දැනගන්නට ලැබෙන්නේ යම්කිසි ආකාරයකට සංඥා මගින් ය. පසුගිය ලිපියෙහි සඳහන්වන්නේ අදාළ සංඥා පාදයේ ඇඟිල්ලෙහි සිට රුධිරය ඔස්සේ මොළයට යන බව ය. එහෙත් එසේ සඳහන් වීම වරදක් වෙයි. ඒ නිවැරදිව සඳහන් විය යුත්තේ පාදයේ ඇඟිල්ලෙහි සිට සංඥාවක් මොළයට යන්නේ ස්නායු ඔස්සේ බව ය. වෙනත් වචනවලින් කියන්නේ නම් සංඥා මොළයට යැවීම පිළිබඳ සංසිද්ධිය සඳහන්වන විට රුධිරය ඔස්සේ සංඥා යැවෙන්නේ ය යන්න වෙනුවට සංඥා ස්නායු ඔස්සේ යන්නේ ය යන්න ආදේශ විය යුතු ය. අදාළ පරකෂණයෙහි දී එවිට අවශ්‍ය වන්නේ සංඥා ස්නායු ඔස්සේ පාදයේ ඇඟිල්ලේ සිට මොළයට යෑමට ගතවන කාලය ගණනය කර ගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva